විල්ගමුව ප්‍රාදේශීය සභාව
------------------------------
මාතලේ දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

**2019** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **2020** මැයි **11** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව **2020** මැයි **30** දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව **2020** මැයි **31** දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් **2019** දෙසැම්බර් **31** දිනට විල්ගමුව ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.**1,471,340** ක වෙනසක් විය. | වෙනසට හේතුව සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | **2020** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය රු.**291,590** ක් ලී බඩු හා සවිකිරීම් යටතේ දක්වා තිබුණි. | ලී බඩු හා සවිකිරීම් ගිණුම නිවැරදි කළ යුතු වේ. | **2020** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | තොග ගබඩා ගිණුම රු.**364,655** ක් අඩුවෙන් දක්වා තිබුණි. | තොග ගබඩා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | **2020** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ පොදු ගබඩා ක්ෂේත්‍ර ගබඩා, ලිපිද්‍රව්‍ය ගබඩා අවසන් තොග ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂ අවසානයේදී ගබඩා තොග ගණනය කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතු වේ. | **2020** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (v) | පුරනැගුම ව්‍යාපෘතියෙන් ලැබී තිබුණ ජල නල උපාංග ගණනය කර අවසාන තොගයට ගෙන නොතිබුණු අතර වර්ෂය අවසානයේදී ජල ගබඩා තොග ශේෂය රු.51,443 ක බැර ශේෂයක් විය. | ජල ගබඩා තොග ශේෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතු වේ. | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි නිවැරදි කරන බව දන්වමි. |
| (vi) | ඇස්තමේන්තුගත වටිනාකම රු.1,085,000 ක් වූ ව්‍යාපෘති 02 ක් සඳහා අත්තිකාරම් වශයෙන් රු.217,000 ක් ගෙවා තිබියදී ණයහිමි වශයෙන් මුළු ඇස්තමේන්තු වටිනාකම ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයහිමියන් රු.217,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ණයහිමි ගිණුම නිවැරදි කළ යුතු වේ. | 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි නිවැරදි කරන බව දන්වමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.910,704 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ ලැබීමට ඇති ගිණුම් ශේෂ කඩිනමින් අයකළ යුතු වේ. | ශේෂයන් නිරවුල් කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.101,676,086 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ වටිනාකම් වල අදාළව සුදුසු සාක්ෂි සහිතව ලේඛන පවත්වාගත යුතු වේ. | නිවැරදි කිරීම් සිදු කිරීමට විෂය නිලධාරීන් වෙත උපදෙස් දී ඇති බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ රු.1,073,365 ක ලී බඩු හා සවි කිරීම් ඉවත් කිරීම් ලෙස දක්වා ඇතත් එම අගය උපලේඛන මඟින් තහවුරු කරගත නොහැකි විය. | ඉවත් කළ වටිනාකම් වලට අදාළ උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | සභාවට අයත් මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් මාර්ග ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ගැසට් කිරිම කළ යුතු වේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 217 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස් 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පී.එස් 46 ප්‍රකාරව ලේඛන පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.12,559,960 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,012,600 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිකුත් කර මාස 06 ක් ඉක්මවා තිබූ රු.99,835 ක් වටිනා චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | උපලබ්ධි නොවූ චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 637,907 | 276,316 | 725,208 | 739,717 | 261,808 | 680,000 | 735,479 | 498,701 |
| බලපත්‍ර ගාස්තු | 900,000 | 1,985 | 791,734 | 791,734 | 1,985 | 1,000,000 | 715,010 | 715,010 |
| කඩ කුලී | - | 900,069 | - | - | 900,069 | 36,000 | 36,000 | 36,000 |
| වෙනත් ආදායම් | 10,375,000 | 2,814,156 | 8,933,454 | 8,633,367 | 3,114,242 | 12,450,000 | 17,422,051 | 5,601,031 |
| | 11,912,907 | 3,992,526 | 10,450,396 | 10,164,818 | 4,278,104 | 14,166,000 | 18,908,540 | 6,850,742 |

### 2.3.2 වරිපනම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ වරිපනම් ආදායම රු.739,717 ක් විය. | ප්‍රාදේශීය සභා පනත හා මූල්‍ය හා පරිපාලන රීති වලට අනුව කටයුතු කර හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එනු ලබන හිඟ කඩකුලී රු.897,069 ක් විය. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | මෙම මුදල් කපාහැරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර ඇති බව දන්වමි. |

2.3.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට වෙනත් ආදායම් රු.14,935,262 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ වටිනාකම රු.13,438,168 ක් හා මුද්දර ගාස්තු රු.288,100 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීම කළ යුතු වේ. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් දක්වමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි මූල්‍ය ඉලක්කයන් දක්වා නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මට මූල්‍ය ඉලක්කයන් ඇතුළත් කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදාහනාගාරයට යන මාර්ගය සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,770,000 ක් වැය කර තිබුණද වර්ෂා කාලයේදි අදාළ මාර්ගය භාවිතා කළ නොහැකිව තිබුණි. | ඇස්තමේන්තු කිරීමේදී ඵලදායි ලෙස මාර්ග ප්‍රයෝජනයට ගතහැකි ආකාරයෙන් කටයුතු කිරීම සභාවේ වගකීම වීම. | මාර්ගය සංවර්ධනය සඳහා කටයුතු කරන බව දන්වමි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.3,483,005 ක වියදමක් දරා තිබුණද කසළ නිසි කළමනාකාරිත්වයකින් තොරව රජයේ වැව් රක්ෂිත ඉඩමකට දිනපතා බැහැර කරමින් පැවතුණි. | කසළ කළමනාකරණය විධිමත්ව සිදු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාවට සුදුසු ඉඩමක අයිතිය නොමැති වීම මේ සඳහා හේතු වී ඇති බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් අනාවරණය වී ඇති රු.54,303 ක පුස්තකාල පොත් ඌණතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි. |
| (ආ) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් අනාවරණය වී ඇති රු.98,000 ක GI බට ඌණතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභය අයකළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් වන විමර්ශන මණ්ඩලයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු** | | |
| **සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ තනතුරු 21 ක පුරප්පාඩු පැවතුණි.** | **සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ.** | **විගණිත කරුණු පිළිගනිමි.** |
| **(ආ) සේවක ණය** | | |
| (i) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ** XXIV **පරිච්ඡේදයේ 3.5 වගන්තියේ සඳහන් සීමාවන් නොසලකා හැර 2019 වර්ෂයේද මාස 10 යේ වැටුප් ණය අත්තිකාරම් ගෙවා තිබුණි.** | **ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.** | **ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව දන්වමි.** |
| (ii) **වර්තමානයේ සභාවේ සේවයේ නියුතුව නොමැති නිලධාරින්ගේ දෙදෙනෙකුගෙන් සේවක ණය වශයෙන් රු.46,316 ක මුදලක් අයවිය යුතුව තිබුණි.** | **හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ.** | **මෙම ශේෂ කපාහැරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇති බව දන්වමි.** |

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **වත්කම් ලේඛනගත නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **2017 වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතිය මඟින් සභාව වෙත ලබාදුන් ජල උපකරණ තොගය ලේඛනගත කර නොතිබුණි.** | **සභාවේ වත්කම් හඳුනා ගෙන ලේඛනගත කළ යුතු වේ.** | **2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.** |

3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවට අයත් අක්කර 2 ½ ක් පමණ වන ගුරුවෙලයාය පොදු සුසාන භූමියේ අක්කර ½ කට වැඩි කොටසක් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි. | සභාවේ වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

3.4.3 පවරානොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති වාහන 05 ක් පවරා ගෙන නොතිබුණි. | අදාළ වාහන පවරා ගැනීම කළ යුතු වේ. | වාහන පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.4.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගනු නොලබන වාහන 08 ක් නැවත භාවිතයට ගත නොහැකි මට්ටමක පැවතුණි. | වාහන අලුත්වැඩියාව හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහන වෙන්දේසි කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු වාර්තා ලබාගැනිමට ඉල්ලීම් කර ඇති බව දන්වමි. |
| (ආ) | 2006 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද විදුලි ජනන යන්ත්‍රයක් ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ තිබුණි. | වත්කම් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම කළ යුතු වේ. | අලුත්වැඩියා සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව සභාව සතු ඇතැම් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව වාහන වල ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇති බව දන්වමි. |

3.6 දෘෂ්‍ය අක්‍රමිකතා
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2018 විශේෂ ආර්ථික යටිතල පහසුකම් නගාසිටුවීමේ වැඩසටහන යටතේ වකුගඩු රෝගීන් වෙසෙන නිවාස 103 කට ලීටර් 500 ජල ටැංකි ලබාදීම සඳහා රු.478,900 ක් වටිනා ජල ටැංකි 103 ක් මිලදී ගෙන තිබුණද එම ජල ටැංකි තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ලබානොදී ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් විසින් ප්‍රදේශයේ මරණාධාර සමිති හා වෙනත් පුද්ගලයන්ට ලබාදී තිබුණි. | තෝරා ගත් ප්‍රතිලාභීන් වෙත භාණ්ඩ බෙදා දීම කළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. |

3.7 ප්‍රසම්පාදනය
--------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසාම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගැඹුරුඔය වසමේ පාසල් මාර්ගය සංවර්ධනය කිරීම | | |
| | වියාපෘතිය සඳහා බෙදුම් ඇල ඩී 58/59 ගොවි සංවිධානය සමඟ රු.835,000 කට ගිවිසුම්ගතව වැඩ නිමකර තිබුණද භෞතික පරීක්ෂාවේදී මාර්ග තලය හා වැඩ නිමකර තිබූ බෝක්කු මතුපිට මාර්ග තලයට බොරළු දමා සකස් කර නොතිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව මාර්ගය සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රමාණවත්ව දායක විය හැකි පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරිමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වේ. | සේවක පුරප්පාඩු හේතුවෙන් මෙම තත්වයන් ඇතිවී ඇති බව දන්වමි. |
| (ආ) | අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්මක් කළමනාකරණ හා විගණන කමිටුවට ඉදිරිපත් කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |